# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2375/03 – 2024 මාර්තු මස 11 වැනි සඳුදා – 2024.03.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2024 අංක 30 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/10/2022/MV/144.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: BD/EL/LND/69B/AQUSN/05.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී. –** ප්‍රාදේශීය ලේකම්, ඇල්ල.

2. **ඉඩමේ විස්තරය.–** ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 69B, හීල්ඔය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කිනලන්වත්ත (උඩකුඹල්වෙල) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/ELL/2023/1231 හා 2023.12.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – කිනලන්වත්ත – ප්‍රමාණය: හෙක්. 6.0703**
උතුරට: වයි. සී. ඩී. වීරක්කොඩි හිමිකම් කියන බුලත්දෙවිලෙපතන සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: වයි. සී. ඩී. වීරක්කොඩි හිමිකම් කියන බුලත්දෙවිලෙපතන, මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ වතුපාර; දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා), වතුපාර සහ නමුණුකුල වැවිලි සමාගම හිමිකම් කියන කිනලන්වත්ත; බටහිරට: නමුණුකුල වැවිලි සමාගම හිමිකම් කියන කිනලන්වත්ත.

EOG 03 - 0077



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 (අ) අතුරු විධාන ආඥාව

**2023 අංක 57 දරන ආඥාව**

මගේ අංකය: 4-3/12/2021/RE/372.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 2/1/15/34 (ii).

අංක 2331/11 හා 2023.05.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 4A පිටුවෙහි සිංහල භාෂාවෙන් පළ කරන ලද 2023 අංක 57 දරන ආඥාවේ, ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) යන්නට පසුව හා 2023 අංක 57 දරන ආඥාව යන්නට පෙර ''38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව'' යන්න ඇතුළත් වීමෙන් සංශෝධනය වියයුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03 - 0078

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 29 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/99/FR/81.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ල/ප්‍රාලේ/3/3/5/4/2.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. –** ප්‍රාදේශීය ලේකම්, ලග්ගල - පල්ලේගම.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, ඇටන්වල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇටන්වල ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක භූ.මූ.පි. 21, අතුරු පිඹුරු අංක 57, පත්‍ර අංක 10 ඉ.වි.ලැ. පිටු අංක 90 හා 2009.05.29 දිනැති භූලක්ෂණාත්මක මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 484 – හුරිගස්මුල්ල ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.2129**

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: කැබලි අංක 485.

EOG 03 - 0079

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.